# අයුබෝවන්

ඔබ මළ මුත් මට නැත වැටහෙන්නේ
ජීවිතයේ අරුමය එය මැයි
එතෙර ගියෙම් ධන සම්පත් සොයා
මෙතෙර ඔබේ රුව වියැකී ගියා

දරුවන් දුටුවද වෙසතුරු මවේ
උන් දන් දුන්නද මහළුවියේ
පැතුවේ බුදුවෙන්නද මතුදා
හැඟුනිද දරුදන් දුන්සේමා

කෙදිනක හෝ අප යළිහමුවේ
උපන් අයට හිමි මරණ සුවේ
මරණය අරඹයි මතුඅත්භවේ
එහෙයින් සමු ගනුදෙනු නොමවේ

වික්‍රම්
March 10, 2001

©2001 by author. This work may be printed and/or distributed **freely** provided this statement is intact. However, this work may not be produced commercially or included in *any media that is sold to the public* without written permission from the author. It may be used as lyrics or associated with any other form of artwork, provided proper and customary credits are given.